● අංක **36** සිට **47** තෙක් ප්‍රශ්න සඳහා දී ඇති හිස්තැන්වලට ගැළපෙන පිළිතුරු සපයන්න.

**36.** 
A


B

**A** හා **B** රූපවලින් දැක්වෙන්නේ ලෝහපාසාද භූමියෙන් හමු වූ භාණ්ඩ වාදන වාමන රූප දෙකකි. ඒවායින් **A** රූපයෙහි දැක්වෙන සංගීත භාණ්ඩය ...................... වන අතර, **B** රූපයෙහි දැක්වෙන භාණ්ඩය ...................... වේ.

**37.** 'කන්දෙ ගෙදර පොඩි අක්කට බත් බෙදන්න රන් හැන්දයි' යන ගී පාදයේ සඳැස්මත් ගණන .................ක් වන අතර ගුරු අක්ෂර ගණන .................... ක් වේ.

**38.** 'මං ලෙස සොබනා ලොවේ වෙන ඇද්දෝ අඟනා' යන ගීතය ගයනු ලබන චරිතය ............................. වන අතර එහිදී තාල වාදනය සඳහා ............................ බෙරය යොදා ගනු ලැබේ.

**39.** ................................... සිංහල චිත්‍රපටයේ එන 'අන්න සුදෝ අර පාට වලා' යන ගීතය ........................ හින්දි චිත්‍රපටයේ එන 'අජ්නි කහෝ කුච් මේරි සුනෝ' ගීතය අනුව නිර්මාණය වූවකි.

**40.** 'බහුවිධ බුද්ධිය' න්‍යාය ඉදිරිපත් කරමින් ............................... විසින් බුද්ධි වර්ග අටක් හඳුන්වා දී ඇති අතර, ඉන් සංගීතයට වඩාත් සම්බන්ධ වන්නේ ............................ බුද්ධියයි.

**41.** පණ්ඩිත් අසිස් චන්ද්‍ර බෙනර්ජි ...................... වාද්‍ය භාණ්ඩය සඳහා ද, උස්තාද් අලි අක්බාර් ඛාන් ...................... වාද්‍ය භාණ්ඩය සඳහා ද සුප්‍රසිද්ධ ය.

**42.** ...................... රංග ශෛලියෙහි 'ඉන්නිසය' සහ 'තෝඩායම' ගායනය කරනු ලබන චරිත නාමය ...................... ලෙස හැඳින්වේ.

**43.** 'කපන කොටන බිම පෙරළන' යන ජන ගීය ................................ ගී වර්ගයට අයත් වන අතර 'බානුසේ ගිමා සඳදෙය' යන ජන ගීය ....................................... ගී වර්ගයට අයත් වේ.

**44.** චීන සංගීත විකාශය පිළිවෙළින් ප්‍රාරම්භ යුගය, .................... යුගය, ජාතික යුගය සහ ....................... යුගය වශයෙන් යුග හතරකට වර්ග වේ.

**45.** ................................. සංගීත පද්ධතියේ එන තිල්ලානා ගායන ශෛලිය, හින්දුස්තානි සංගීතයෙහි ............................ ගායන ශෛලියට සමාන ලක්ෂණ පෙන්නුම් කරයි.

**46.** 'රන්මුතු දූව' චිත්‍රපටය සඳහා ................................................. සූරීන් ද, 'පරසතු මල්' චිත්‍රපටය සඳහා ................................................ සූරීන් ද සංගීත නිර්මාණයෙන් දායක වී ඇත.

**47.** ගනිරිග, මසගම වශයෙන් යෙදෙන ශුද්ධ ස්වර අභ්‍යාසයෙහි ආරෝහණ රූපයෙහි තෙවන සහ සිවුවන ස්වර ඛණ්ඩ පිළිවෙළින් ................. සහ .................... වේ.

● අංක **48** සිට **50** තෙක් ප්‍රශ්නවල දී ඇති හිස්තැන් පිරවීම සඳහා පහත වරහන තුළ දී ඇති වචන පමණක් උපයෝගී කරගන්න.

[ඔපෙරා (Opera), කවුන්ටර්පොයින්ට් (Counterpoint), බිට්ස් (Bits), සංධ්වනි (Symphony), රීසන් (Reason), සිබේලියස් (Sibelius), ඇඩෝබි ඔඩිෂන් (Adobe Audition)]

**48.** පරිගණකය ආශ්‍රිතව, සංගීත නිර්මාණය සඳහා ............................ මෘදුකාංගය ද හඬ සංස්කරණය සඳහා ............................ යනුවෙන් හඳුන්වන මෘදුකාංගය ද යොදාගත හැක.

**49.** ගීතයක පදමාලාවේ අදහස තීව්‍ර කිරීම සඳහා යොදන සමාන්තර ස්වර රචනා .................... යන නමින් හැඳින්වෙන අතර, ගී පද අතරෙහි සම්බන්ධතාවය සඳහා යොදන වාදන කොටස් .................... යන නමින් හැඳින්වේ.

**50.** බටහිර ගීත නාට්‍ය ............................ නමින් ද, කිසියම් තේමාවක් මත නිර්මාණය කරනු ලබන සංගීත සංරචනය ...................... නමින් ද හඳුන්වනු ලැබේ.

***

